2019.7.24 රිවිරැස පිටුව 5

# මැයි මස 3.5%ක් වූ උද්ධමනය ජූනි මස 2.1% දක්වා පහළට

**බද්දේගම - ඕ. කමලනාථ්**

ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, මැයි මාසයේ සියයට 3.5ක් වූ බවත් එය ජූනි මාසයේදී සියයට 2.1 දක්වා පහළ ගොස් ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුවේ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව නිකුත් කළ නිවේදනයක දැක්වේ. එය මාස පහකින් වාර්තා වූ අවම උද්ධමනය වීම විශේෂත්වයකි.

2019 ජූනි මාසයේදී ආහාර සහ ආහාර නොවන යන කාණ්ඩ දෙකෙහිම ලක්ෂ්‍යමය උද්ධමන අගයන් පිළිවෙළින් සියයට -0.4හි සහ සියයට 6.7හි සිට සියයට -2.9 සහ සියයට 6.2 දක්වා පහළ යන ලදී.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජා.පා.මි. දර්ශකයෙහි වෙනස 2019 ජූනි මාසයේදී සියයට 2.0හි නොවෙනස්ව තිබිණි.

මාසික වෙනස්වීම් අනුව, ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකේ අයිතමයන්හි මිල ගණන්වල දක්නට ලැබුණු ඉහළ යෑම් හේතුවෙන්, 2019 ජූනි මාසයේදී ජා.පා.මි. ද සියයට 0.4කින් ඉහළ ගියේය. ආහාර කාණ්ඩයෙහි මාළු, ලොකු ලූනු, අමු මිරිස්, රතු ලූනු සහ සහල් මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා විය. මීට අමතරව ආහාර නොවන කාණ්ඩයෙහි ප්‍රවාහන, ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයන්හි අයිතමවල මිල ගණන්ද ජූනි මාසයේ ඉහළ ගියේය.